දශක තුනක් තිස්සේ උතුරේ පැවැති යුද්ධයේ අවසාන දින කිහිපය තුළදී රජයේ හමුදාවන්ට බාරවූ එල්.ටී.ටී.ඊ. ඉදිරි පෙළ සාමාජිකයන් අතර එම සංවිධානයේ දේශපාලන අංශයේ කාන්තා නායිකාව තමිළිනී ජෙයක්කුමාරන් ද විය. යුද ජයග්‍රහණයෙන් පසුව රජය ක්‍රියාත්මක කළ පුනරුත්ථාපන වැඩ පිළිවෙළ යටතේ නැවත සමාජ ගත කෙරුණු ඇය ඉන් වසර කිහිපයකට පසුව මහරගම පිළිකා රෝහලේදී ජීවිතක්ෂයට පත්වූයේ පිළිකා රෝගියෙකුවය. පිළිකා රෝගයට ගොදුරුව මරණය අභිමුව සිටියදී ඇය එල්.ටී.ටී.ඊ. සංවිධානය හා සම්බන්ධ සිය ක්‍රියාකාරකම් සහ බිහිසුණු අත්දැකීම් පිළිබඳ තබන ලද ලිඛිත සටහන් පසුව දෙමළ භාෂාවෙන් පොතක් ලෙස ප්‍රකාශයට පත් කෙරිණි. එහි ඇතුළත් කරුණු දෙමළ සමාජය තුළ මහත් විවාදයටද, බාහිර සමාජයේ මහත් අවධානයටද ලක්වීය.

අතිමහත් සමාජ පිරිවැයක් දරමින් එල්.ටී.ටී.ඊ. යුද සංවිධානය වැනසීමට රජයේ හමුදා සමත් වුවද, එම සංවිධා-නයේ නැඟීමට සහ පැවැත්මට බලපෑ හේතු නැසීමට රජය මෙතෙක් සමත්වී නැත. උතුරේ දෙමළ ජාතිවාදයද, නැඟෙනහිර මුස්ලිම් ජාතිවාදයද, දකුණේ සිංහල ජාතිවාදයද මේ මොහොතේ නව වටයකින් හිස ඔසවමින් සාමකාමී පුරවැසි සමාජයට සන්නිවේදනය කරන පනිවිඩයද බෙහෙවින් භයානකය. එවැනි පසුබිමක මද අස්වැසිල්ලක් භුක්තිවිඳිමින් සිටින දැනුම්වත් සිංහල පුරවැසි සමාජයට තමිළිනීගේ මරණාසන්න ස්මරණය මගින් ලබාදෙන පනිවිඩයේ ඇති සුවිශේෂීත්වය සළකා එහි සිංහල පරිවර්තනය කොටස් වශයෙන් ඔබ වෙත ගෙනඑන්නෙමු.

තමිළිනී දෙමළ බසින් තැබූ සටහන් සිංහලයට නැඟූ ආචාර්ය ස්වාමිනාදන් විමල් සහ ඒ සඳහා අවශ්‍ය සෙසු සම්පත්දායකත්වය සැපයූ සිනමාවේදී ධර්මසිරි බණ්ඩාරනායක දෙපළට මෙහිදී අපගේ විශේෂ ස්තුතිය පිරිනමමු.

සන්නසට සකස් කරන්නේ - ශ්‍රීලාල් සෙනෙවිරත්න




9

මෙසේ මාස තුනක් ගතවූ පසු මමත් තවත් සටන්කාමී සහෝදරියකුත් තිරුනෙල්වේලිහි පිහිටා තිබූ විමුක්ති කොටි සංවිධානයෙහි කාන්තා පෙරමුණේ මධ්‍යස්ථානයට යවන බවට දැනුම් දුන්නේය. එය වගකීම් භාර සහෝදරිය තුළ අපේ දක්ෂතාවන් පිළිබඳ වූ විශ්වාසය නිසා හෝ වෙනත් හේතුවක් නිසා හෝ විය හැකිය. අදාළ ස්ථානයේ ලිපිනය පමණක් ලබාදී අප දෙදෙනාව එහි යැවීය. මම නිවසෙහි සිටි සමයේදී වැඩිහිටියන් සමඟ යාපනයට ගොස් ඇත්තෙමි. යාපනය බස් නැවතුම්පළ, නල්ලූරු මුරුගන් කෝවිල, අයිස්ක්‍රීම් කඩ සහ මලායන් කැෆේ යනාදිය පිළිබඳව හැර වෙනත් ස්ථානයක් පිළිබඳව මා දැන සිටියේ නැත. පූනගරි-සංගුපිටි මාර්ගයෙන් යාපනය සඳහා ගමනාගමන කටයුතු සිදුවෙමින් පැවතිණ. කෙසේ හෝ සංගුපිටි මාර්ගය පසුකර මරවන්පුලව් හරහා චාවකච්චේරි හන්දියට ළඟා වූවෙමු. මා සමඟ පැමිණි සටන්කාමී සහෝදරිය ධර්මපුරම් ප්‍රදේශයේ අයෙකු විය. ඇයගේ පියා විදුහල්පතිවරයෙකු වූ අතර මව පාසල් ගුරුතුමියක වූවාය.

යාපනයේ තිරුනෙල්වේලි වෙත යා යුත්තේ කුමන මාර්ගයේ දැයි නොදැන සිටිද්දී මාර්ගයෙහි පැමිණෙමින් තිබුණු වාහනයක් හිතේ ධෛර්යෙන් සංඥාවක් කර නතර කර ගත්තෙමු. වාසනාවකට එම වාහනයේ උන්නේ සංවිධානයේ සහෝදරයන්ය. හිතේ සැනසුමෙන් යුතුව ''අයියේ තිරුනෙල්වේලිවල දේශපාලන සාකච්ඡාවකට යන්ඩ ඕනෑ'' යැයි කීවෙමු. ''ආ... දේශපාලන ළමයිද ඔයාලා ?'' යැයි අසමින් ඔවුහු අප වාහනයට නංවාගත්හ. එම සටන්කාමී සහෝදරවරු අපි යා යුතු ස්ථානයෙහි කඳවුරු පරිශ්‍රය ඇතුළටම වාහනයෙන් රැගෙන ගොස් බස්සවා පසුව පිටව ගියහ.

ප්‍රමාණයෙන් එය විශාල කඳවුරක් විය. විමුක්ති කොටින්ගේ කාන්තා අංශයේ ඉහළ පාලන වගකීම් දරන බොහෝ සාමාජිකාවෝ එහි උන්හ. තවත් සමහරු හමුවීම සඳහා

## ප්‍රභාකරන් අණ්ණා මුණගැසීම

පැමිණ සිටියහ. සෑම මොහොතකම ඔවුහු යුහුසුළුව ක්‍රියාත්මක වූහ. වන්නියේ සිට එවන ලද අලුත් සාමාජිකාවන් වූ අපගේ විස්තර විමසා දැනගත් අතර සමහර පැහැදිලි කිරීම් ද කෙරිණ. මා සමඟ පැමිණි සටන්කාමී සහෝදරිය වෙනත් කඳවුරකට යැවීමෙන් පසුව වගකීම් භාර සහෝදරිය තම කාර්යාලයෙහි වැඩ සැළසුම් වාර්තා මගේ අතට දුන්නාය. එම වාර්තා ලිවිය යුත්තේ කෙළෙසද යන්න පිළිබඳව වෙනත් සහෝදරියක් පැහැදිලි කළාය. එම වාර්තා සංවිධානයේ නියෝජ්‍ය නායක තනතුර දැරූ 'මහත්තයා' අයියා වෙත යවන බව ඇය පැවසුවාය.

වාර්තා පිළිබඳ වගකීම දැරූ ජ්‍යෙෂ්ඨ සාමාජිකාවගේ සහායට සිටි මා වෙත අසීමිත ලෙස වැඩ කටයුතු පැටවීය. මාසය අවසානයේ සෑම දිස්ත්‍රික්කයකින්ම එවන වාර්තා සංස්කරණය කර ලිවීම ලෙහෙසි පහසු කාර්යයක් වූයේ නැත. වාර්තා සෑම එකක්ම අවධානයෙන් යුතුව කියවා පොදු මාතෘකා යටතේ එම දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කළ වැඩසටහන් පිළිබඳ තොරතුරු සටහන් කළ යුතුය. මා වෙත පැවරූ මෙම කාර්යභාරය හේතුවෙන් සංවිධානයෙහි දේශපාලන අංශයේ සටන්කාමී සහෝදරියන් විසින් සිදුකරන ලද වැඩසටහන් පිළිබඳවත් ඒ ආශ්‍රිත ප්‍රායෝගික ප්‍රශ්න පිළිබඳවත් මට මනා අවබෝධයක් ලබාගැනීමට අවස්ථාව ලැබුණි. යාපනය දිස්ත්‍රික්කයේ දේශපාලන අංශය විසින් පවත්වන ලද රැස්වීම්වල කතා පවත්වන සටන්කාමී සහෝදරියන්ගේ නම් ලැයිස්තුවට මගේ නමත්, අපේ කාන්තා අංශයේ භාරකාර සහෝදරිය විසින් එකතු කරන ලදි. ඔවුන් මා වෙත ලබාදෙන ලැයිස්තුවට අනුව රැස්වීම් පැවැත්වෙන ස්ථානයට නියමිත වේලාවට ගොස් සහභාගිවීම මගේ වගකීම විය. මේ නිසා වඩමාරච්චි තෙන්මාරච්චි වලිකාමම් යනාදී බොහෝ ප්‍රදේශවලට යාමට මට සිදුවිය. සංවිධානයෙහි වැඩකටයුතු පිළිබඳව දීර්ඝ කාලීන අත්දැකීම් සහ දැනුම සහිත ඉහළ පෙළේ වගකීම් භාරව කටයුතු කළ සටන්කාමීයෝ සේනාධිපතිවරු සහ ජ්‍යෙෂ්ඨ සාමාජිකයන් අතරේ මූලික පුහුණුව පවා ලබා නොමැති මා වෙත කථා පැවැත්වීම පැවරිණ. මහත් බියක් සහ චකිතයකින් යුතුව මා කතා පැවැත්වූ බව සත්‍යයකි. නමුත් මම මගේ කතාව අසා සිටින අයගේ අවධානයට යොමුවන තත්ත්වයට ගැලපෙන සේ එය සකස් කර ගැනීමට උත්සුක වුණෙමි. ඒ සඳහා ගැටුම්වලදී තුවාල ලබා සිටි ජ්‍යෙෂ්ඨ සාමාජිකයන්ගේ අත්දැකීම් මහත් උනන්දුවෙන් අසා දැන ගත්තෙමි. කොටි සංවිධානය විසින් ප්‍රකාශයට පත් කරන ලද පොත් සඟරා සොයාගෙන ඒවා සියල්ලක්ම මහත් අවධානයෙන් යුතුව කියවූවෙමි. දිනක් මගේ කතාවට සවන් දුන් 'මාත්තෙයා' අයියා මහත් වේගයෙන් අත්පොළසන් දී 'මෙන්න මෙහෙම තමයි සංවිධානයේ අය කතා පවත්වන්න ඕන' යැයි කියමින් මා ප්‍රසංශාවට ලක් කළේය. තවත් ජ්‍යෙෂ්ඨ සාමාජිකයන් කීපදෙනෙකුගේම ප්‍රසංශා මට හිමිවූ අතර ජනතාවට ගැලපෙන ලෙස ඔවුන්ට තේරෙන අන්දමින් කථා පැවැත්වීමටද මහත් වෙහෙසක් දරා කටයුතු කළෙමි. පසු කළෙක ජනතාව ලක්ෂ ගණනක් රැස්ව සිටි 'පොංගුතමිල්' උත්සවයෙහි එක් රැස්වීමක කොටි සංවිධානය නියෝජනය කරමින් කථාවක් කිරීමේ මහත් විශාල වගකීම සංවිධානයේ නායකත්වය විසින් මහත් විශ්වාසයෙන් යුතුව මා වෙත පවරණ ලදි. මෙවැනි මහජන රැස්වීම්වලට සහභාගි වෙමින් සිටියත් මා කාන්තා අංශයේ ප්‍රධාන මධ්‍යස්ථානයෙහි වාර්තා සැකසීමේ කටයුතුවල සහායිකාවක් යැයි හීනමානයක් මගේ හිතේ සෑම මොහොතකම තිබුණි. එයට හේතු වූයේ සටන්කාමියාට ඉතාමත් අවශ්‍ය ආයුධ පුහුණුව සඳහා මා නොයැවීමයි. දේශපාලන අංශයෙහි මා මෙන්ම ආයුධ පුහුණුව නොලැබූ තවත් සටන්කාමී සහෝදරියෝද උන්හ. මා සිටි කඳවුරේ පමණක් සිටි එවැනි පිරිස විස්සකට අධික විය.

දිනක් එක්වරම අපේ කඳවුර එක්තරා වැදගත් සාමාජිකයෙකු පිළිගැනීම සඳහා සූදානම් විය. අපට අලුත් සුදු කමිස සහ කළුපාට දිග කලිසම්ද අලුත් සපත්තුද ලබාදුන්නේය. රැස්වීමට සහභාගිවන්නන් සඳහා තේ පැන් සහ කැවිලිවලින් සංග්‍රහ කිරීමේ වගකීම පැවරුණේ අපේ කණ්ඩායමටයි. අපි එයට ගැලපෙන අයුරින් සූදානම්ව බලා සිටියෙමු. වෙනත් වැඩපුර විස්තර කිසිවක් අපි නොදැන උන්නෙමු. සංවිධානය තුළ අනවශ්‍ය තොරතුරු ලබාගැනීමට උත්සාහ කිරීම යනු මහත් වරදක් ලෙස සලකති.

සුළු මොහොතකින් පැජරෝ වර්ගයේ වාහනයක් පැමිණ නතර විය. ස්වර්ණම් සහ තව කීප දෙනෙක් වාහනයෙන් බැස පැමිණියහ. ඔවුහු රැස්වීමේ සංවිධාන කටයුතු සහ අවට සෝදිසි කර බැලූහ. පසුව කඳවුර වටකරගෙන ආරක්ෂක වළල්ලක් ලෙස උන්හ.



36 වන පිටට

සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර ගුවන්විදුලිය www.thisara.com